1 TEAM 1 NATION

Sri Lanka Cricket

# ‘ශ්‍රී ලංකා ක්‍රිකට් Pace Ace - 2020’ වැඩසටහනට අනුග්‍රාහකයකු සොයා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI)

ජාත්‍යන්තර සන්නාමයක් වශයෙන් ලෝකය තුළ දැඩි පිළිගැනීමකට ලක්ව සිටින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, අනාගතයේදී ජාතික කණ්ඩායම නියෝජනය කිරීමට හැකියාවෙන් හෙබි එහෙත් සිය හැකියාව ජාතික මට්ටමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව නොලද වේග පන්දු යවන්නන් හඳුනා ගැනීම වෙනුවෙන් දිස්ත්‍රික්ක මට්ටමින් ‘Pace Ace - 2020’ නම් දක්ෂතා ගවේශන වැඩසටහනක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. දිවයින පුරා විසිරී සිටින කුසලතාවයන්ගෙන් පිරි ක්‍රීඩකයින් සෙවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සිදුකරගෙන යනු ලබන වැඩපිළිවෙළට සැලකිය යුතු දායකත්වයක් මෙමඟින් ලැබෙනු ඇති බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අපේක්ෂාවයි.

ඒ අනුව ‘ශ්‍රී ලංකා ක්‍රිකට් Pace Ace - 2020’ වැඩ සටහනෙහි එකම අනුග්‍රාහකයා ලෙසින් කටයුතු කිරීමට උනන්දුවක් දක්වන මෙරට කීර්තිමත් ආයතන වලට ඒ සඳහා ඉදිරිපත් වන ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ආරාධනා කර සිටියි. ශ්‍රී ලංකා ක්‍රිකට් සමඟ අත්වැල් බැඳගනු ලබන ලංසුකරු / අනුග්‍රාහකයාට දිවයින පුරා සිය වෙළෙඳ නාමය ප්‍රචාරණය කරගැනීම සඳහා වූ වාණිජමය අවස්ථාවක් නිර්මාණය වනු ඇත.

ඒ අනුව මේ සඳහා උනන්දුවක් දක්වන ආයතන සිය කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි (EOI) ආයතන අක්තපත්‍රයේ තොරතුරු ඇතුළත් කෙටි හැඳින්වීමක් සමඟ 2020 සැප්තැම්බර් මස 24 වැනි දින ප.ව. 1.00 ට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන **sponsorship@srilankacricket.lk** විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතුය. මෙම කැමැත්ත ප්‍රකාශ කිරීම සම්බන්ධව වැඩිදුර තොරතුරු අපේක්ෂා කරන්නේ නම් ජංගම දුරකථන අංක 0764-127253 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන වෙළඳ කළමනාකරු ඇමතීමෙන් ලබාගත හැක.

උක්ත මාතෘකාගත කාරණය සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම පිළිබඳ වූ ලිපි (EOI) ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවශ්‍යතා හා මාර්ගෝපදේශ සම්බන්ධව සවිස්තරාත්මකව සඳහන් කර ඇති යෝජනාවකින් (RFP) දැනුම් දෙනු ලැබේ.

සැලකිය යුතුයි,

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ අයදුම්කරු අතර අවසන් ගිවිසුම ඇතිකරගන්නා තෙක් මෙම ආරාධනාවෙහි කිසිවක් ගිවිසුම් ගතවීමක් හෝ අයිතිවාසිකමක් (ප්‍රකාශිත හෝ ව්‍යාංගයෙන්) ලෙස සලකනු නොලැබේ.
- මත්පැන් හා සම්බන්ධ සමාගම් (අන්වාදේශ සහ අන්‍යාගමික නොවන) කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට සහභාගිවීමේ අවස්ථාවක් නොමැත.

*කිසිදු හේතුවක් ඉදිරිපත් නොකර, ඕනෑම වේලාවක උනන්දුව ප්‍රකාශ කිරීම සඳහා වන මෙම ආරාධනය (EOI) ස්වකීය අභිමතය පරිදි අවලංගු කිරීමට, සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට පූර්ණ අයිතිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු වේ.*

**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ක්‍රිකට්**